# ද මැසිනොද් විදුහල - කඳාන
## දේශපාලන විද්‍යාව I කොටස

13 වසර කලා

කාලය පැය 2 යි.

6 . 04 . 2018

Learning Resource Center
R
De Mazenod College
Kandana

අංක 1 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් ප්‍රශ්නයේ මාතෘකාවට අදාල නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

01. දේශපාලන විද්‍යාව,

A- රාජ්‍ය සහ ආණ්ඩුව පිළිබඳ විද්‍යාව ලෙස හැඳින්වේ.
B- න්‍යායාත්මක දේශපාලනය සහ ප්‍රායෝගික දේශපාලනය යන කොටස් දෙකෙන් සමන්ත වේ.
C- සාමාජීය විද්‍යා පවුලට අයත් විෂයක් වේ.
D- අතිශයින්ම පෞරාණික අධ්‍යයන විෂයක් වන අතර ක්‍රමානුකූලව අධ්‍යයනය කිරීම ආරම්භ වූයේ ක්‍රි.පූ. 4 වන සියවසේ දීය.
E- විද්‍යාත්මක ක්‍රම මඟින් පමණක් අධ්‍යයනය කළ හැකි විෂයක් වේ.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

02. දේශපාලනය,

A දේශපාලන විද්‍යාවේ ප්‍රායෝගික පැත්ත වේ.
B බල අරගලය ක්‍රියාවට නංවන මාර්ගය වේ.
C සමාජ ප්‍රභූන් විසින් කරනු ලබන ක්‍රියාවක් වේ.
D අගය කිරීම් අධිකාරී බලය යොදා ගෙන බෙදා හරින මාර්ගය වේ.
E කවුරුන් කුමක් කෙලෙස කුමන අවස්ථාවක දී ලබා ගන්නවාද යන්න තීරණය වීමේ ක්‍රියාදාමය වේ.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

03. චර්යාවාදය,

A දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් 1940 ගණන්වලදී ඇමරිකාව තුළ ආරම්භ වූ අධ්‍යයන ව්‍යාපාරයක් වේ.
B දේශපාලන රැගුම්කරුවන්ගේ නිරීක්ෂණය කළ හැකි චර්යාව පමණක් අධ්‍යයනය කළ යුතු බව අවධාරණය කරනු ලැබීය.
C මිනිසුන්ගේ සාර්ව දේශපාලන චර්යාව අධ්‍යයනය කිරීම වර්ධනය කරනු ලැබීය.
D න්‍යාය ගොඩනැගීමට සහ අධ්‍යයනය විධි ක්‍රම වර්ධනය කිරීමට බෙහෙවින් දායක විය.
E ශිල්පීය උපක්‍රමවලට වඩා ප්‍රතිඵල පිළිබඳ වඩාත් සැලකිලිමත් විය.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

04. රාජ්‍යය,

A නිශ්චිත දේශසීමාවන්ගෙන් වටවූ භූමියක් තුළ ජීවත් වන ජනතාව විසින් පිහිටුවා ගත් දේශපාලන සමාජය වේ.
B ග්‍රීක යුගයේ දී නාගරික රාජ්‍යය ලෙස ප්‍රථමයෙන් ආරම්භ විය.
C පොදු ආශාවන් වෙනුවෙන් ක්‍රියාත්මක වීම යන නාමය සහිත විශේෂිත දේශපාලන ආයතන පද්ධතියකින් සමන්විත වේ.
D නීති පැනවීමට සහ නීති කඩකරන අයට දඬුවම් කළ හැකි සුජාතභාවය සහිත අධිකාරී බලයෙන් යුක්ත වූවකි.
E ලිබරල්වාදීන් විසින් පොදු සමාජ සංවිධානයක් ලෙස ද සමාජවාදීන් විසින් පංති ආයුධයක් ලෙසද විග්‍රහ කර ඇත.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

05. ස්වාධිපතීත්වය,

A රාජ්‍යයන් පමණක් භුක්ති විඳින උසස්ම හා උත්තරීතර බලය වේ.
B අභ්‍යන්තර හා බාහිර වශයෙන් දෙයාකාර වන බව විග්‍රහ කර ඇත.
C රාජ්‍යයේ වැදගත්ම සහ විශේෂතම අංග ලක්ෂණය වේ.
D රාජ්‍යයේ ආත්මය වන අතර බලාධිකාරී බලය යෙදවීම සඳහා රාජ්‍යයට සුජාතභාවය සැපයෙන සාධකය වේ.
E ප්‍රබල රාජ්‍යයක් දුබල රාජ්‍යයන්ගෙන් වෙන් කර හඳුනා ගැනීම සඳහා යොදා ගැනෙන නිර්ණායක අතුරින් එකක් වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

06. ආණ්ඩුව,

A දේශපාලන සමාජයේ පොදු කැමැත්ත නියෝජනය කරන රාජ්‍යයේ නියෝජිතයා වේ.
B තම කැමැත්ත ක්‍රියාවට නැංවීම සඳහා රාජ්‍යය විසින් භාවිතයට ගැනන උපකරණය වේ.
C ප්‍රජාතන්ත්‍ර හෝ ප්‍රජාතන්ත්‍ර විරෝධී හෝ විය හැක.
D එක් අයෙකුගෙන් කීප දෙනෙකුගෙන් හෝ බොහෝ දෙනෙකුගෙන් සමන්විත විය හැක.
E ප්‍රජාත්ත්‍රවාදී හෝ ප්‍රජාතන්ත්‍ර නොවන නොවන අයුරින් වෙනස් කිරීමට යටත් වූවක් වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

07. සන්ධීය ආණ්ඩුක්‍රමය,

A විවිධ මට්ටම් සහිත ආණ්ඩු අතර සිරස් ආකාරයට බලය හුවමාරු කර ගැනීමේ පදනම මත ගොඩනැගී ඇත.
B බලතල බෙදීමේ තවත් ක්‍රමයක් ලෙස සලකනු ලැබේ.
C විවිධ වාර්ගික ජන කොටස් එක් දේශපාලන ක්‍රමයකට අනුගත කිරීම සඳහා ප්‍රයෝජනවත් වේ.
D විවිධත්වය සමඟ ඒකීයත්වය බද්ධ කරන ක්‍රමයක් ලෙස විග්‍රහ කර ඇත.
E සජාතීය සමාජ ක්‍රම සහිත රටවල් සඳහා වඩාත් යෝග්‍ය වන බව පිළිගනු ලැබේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

Learning Resource Center
R
De Mazenod College
Kandana

08. ඒකීය ආණ්ඩුක්‍රමය,

A එක් බල මධ්‍යස්ථානයක් පදනම් කොට ගෙන ගොඩනැගී ඇත.
B ජාතික දේශපාලනය පදනම් කරගෙන ජාතික ඒකාග්‍රතාවය වර්ධනය කිරීමට ඉවහල් වේ.
C ඒකීය අධිකරණ ක්‍රමයක් සහ පරිපාලන ක්‍රමයක් පවත්වාගෙන යාමට ප්‍රයෝජනවත් වේ.
D ප්‍රාදේශීය සම්පත් ජාතික ප්‍රතිපත්ති හරහා සමාන අයුරින් ප්‍රයෝජනයට ගැනීමට උපකාරී වේ.
E බහුවිධ සමාජ ක්‍රම සහිත විශාල රාජ්‍යයන්ට වඩාත් සුදුසු වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

09. කැබිනට් ආණ්ඩුක්‍රමය,

A නාමික හා සත්‍ය වශයෙන් හැඳින්වෙන ද්විත්ව විධායකයකින් යුක්ත වේ.
B වැඩි කාර්යක්ෂමතාවකින් සහ අඩු ප්‍රජාතන්ත්‍රවාදීභාවයකින් යුක්ත වේ.
C නාමික විධායකය නායකත්වය දරණ අතර එමඟින් සත්‍ය විධායකය පත් කරනු ලැබේ.
D විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටින නිසා වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් ලෙස සැලකේ.
E රාජ්‍යයේ නායකයා සහ ආණ්ඩුවේ නායකයා එකිනෙකින් වෙන් කරන ලද ආණ්ඩුක්‍රමයක් වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

10. ජනාධිපති ආණ්ඩුක්‍රමය,

A ජනාධිපති නමින් හඳුන්වන ඒකීය විධායකයක් විසින් නායකත්වය දරනු ලැබේ.
B සෘජුව තෝරා පත් කරන විධායකයකින් හා ව්‍යවස්ථාදායකයකින් සමන්විත වේ.
C විධායක හා ව්‍යවස්ථාදායක අතර පවතින දුරස්තර සම්බන්ධතාව විශේෂ ලක්ෂණය වේ.
D ප්‍රජාතන්ත්‍රවාදීභාවයෙන් අඩු සහ කාර්යක්ෂමතාවයෙන් වැඩිවේ.
E දේශපාලන හා ආර්ථික වශයෙන් පසුගාමී රටවල්වලට වඩාත් සුදුසු වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

අංක 11-15 දක්වා ඇති ප්‍රශ්න සමන්විත වන්නේ ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාව හා අදාලව සපයන ලද ප්‍රකාශ පහකිනි. එම ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

11. ස්වාධිපත්‍යය,

A අසහාය සහ අසීමිත බලය පිළිබඳ න්‍යාය හැඳින්වෙන පදය වේ.
B රාජ්‍යයට බලාධිකාරී බලයේ ඒකාධිකාරය සපයනු ලැබේ.
C රාජ්‍යය ක්‍රියාවට නංවන්නේ අධිකරණය හා විධායකය හරහාය.
D රාජ්‍යය අනෙක් සෑම දේශපාලන හා සමාජ සංවිධානවලට වඩා ඉහළින් තබනු ලැබේ.
E අභ්‍යන්තර හා බාහිර වශයෙන් පැතිකඩ දෙකකි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

12. බලතල බෙදීම,

A ආණ්ඩුවේ ප්‍රධාන කාර්යයන් තුන එකිනෙකින් වෙන් කළ යුතු බවට අවධාරණය කරන න්‍යාය වේ.
B ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය හා ජනතාවගේ නිදහස ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අතිශය වැදගත් මූලධර්මයක් ලෙස පිළිගනු ලැබේ.
C එක් අයෙකු අත බලය ඒකරාශී වීම ආඥාදායකත්වයක් ඇති වීමට මඟ පාදනු ලැබේ. යන උපකල්පනය මත ගොඩ නඟා ඇත.
D සන්ධීය ආණ්ඩුක්‍රම තුළ මධ්‍යම ආණ්ඩුව හා සන්ධීය කොටස් අතර බලය බෙදීම සඳහා භාවිතයට ගැනෙන න්‍යාය වේ.
E 1789 ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනයේ දී යොදාගත් මූලික න්‍යායක් වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

13. මිනිසුන් නීතියට යටත් වන්නේ,

A එහි සුජාතභාවය හේතු කොට ගෙනය.
B යටත් නොවීමෙන් මුහුණ දීමට සිදුවන ප්‍රතිඵල පිළිගැනීමට අකමැති නිසාය.
C යහපත් සමාජයක පැවැත්ම සඳහා නීති අවශ්‍ය වනවා යන විශ්වාසය නිසාය.
D නීති සියලු දෙනාටම එක හා සමාන වනවාය යන විශ්වාසය නිසාය.
E බලයේ සිටින ආණ්ඩුවට සහාය දැක්වීමට ඇති කැමැත්ත නිසාය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

14. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ඉතාම වැදගත් මූලධර්ම වන්නේ,

A මැතිවරණවල දී තීරණය කරන ලද පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂවල ශක්තිය මත ආණ්ඩුව පිහිටුවීම.
B ආණ්ඩුව පාර්ලිමේන්තුවේ විශ්වාසය මත රඳා පවතින බැවින් පාර්ලිමේන්තුවට වගකීමට ආණ්ඩුව බැඳී සිටීම.
C විධායකයේ සාමාජිකයන් සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ බහුතර ආසන සංඛ්‍යාවක් හිමි පක්ෂයේ සාමාජිකයන් අතුරින් පත් කිරීම.
D විධායකය සාමූහික එකක් වීම.
E ආණ්ඩුවේ නායකයා වන අගමැති රාජ්‍ය නායක ධුරය හා ප්‍රධාන අණදෙන නිලධාරී තනතුර දැරීම.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

15. ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන මූලධර්ම

A විධායකය හා ව්‍යවස්ථාදායකය එකිනෙකට වෙනස් මැතිවරණ දෙකකින් තෝරා ගැනීම.
B ව්‍යවස්ථාව මඟින් එකිනෙකින් ස්වාධීන වූ බල ක්ෂේත්‍ර දෙකක් විධායකයට හා ව්‍යවස්ථාදායකයට පවරා තිබීම.
C විධායක බලය ජනාධිපතිවරයා අත ඒකරාශී කිරීම.
D රාජ්‍ය නායක හා ආණ්ඩුවේ නායක යන තනතුරු දෙක ජනාධිපති නිලය වටා කේන්ද්‍රගත කර සිටීම.
E විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මඟින් ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකි වීම.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

6. 04. 2018
13 ශ්‍රේණිය

16 - 20 දක්වා ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාලව ප්‍රකාශ පහක් දක්වා ඇත. ඒවායෙන් එක් ප්‍රකාශයක් සාවද්‍ය වේ. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana

16. සමූහ ආඥාදායක ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ,

1. නිල මතවාදයක් තිබීම.
2. රාජ්‍යයේ පාලනයෙන් පූර්ණ ලෙස නිදහස් වූ ආර්ථික ජීවිතය
3. එක පක්ෂයක් පමණක් පැවතීම.
4. ජනමාධ්‍ය සම්බන්ධයෙන් රාජ්‍යයේ ඒකාධිකාරය
5. මර්ධනකාරී පාලන යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම.

17. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

1. රටක දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරීත්වයට අදාල නීති පද්ධතිය අඩංගු ලියවිල්ල වේ.
2. දේශපාලන ක්‍රමයක ජීවත්වන පුරවැසියන්ගේ සමාජ හැසිරීම හා සම්බන්ධ නීති හා රෙගුලාසි දැක්වෙන ලියවිල්ල වේ.
3. ප්‍රජාතන්ත්‍රවාදී සහ නීත්‍යානුකූල පාලනය සඳහා ඉතාම වැදගත් අවශ්‍යතාවයක් ලෙස සැලකේ.
4. ලිඛිත - අලිඛිත සන්ධීය - ඒකීය සහ නම්‍ය - අනම්‍ය ලෙස වර්ග කරනු ලැබේ.
5. මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ඉතාම හොඳ මාර්ගය ලෙස සලකනු ලැබේ.

18. දේශපාලන සංස්කෘතිය,

1. දේශපාලන විශ්ලේෂණය සඳහා නූතනයේ භාවිතයට ගැනෙන වැදගත් මෙවලමක් වේ.
2. දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලය තුළ දී ඇමරිකානු දේශපාලන විද්‍යාඥයින් විසින් ප්‍රචලිත කරන ලදී.
3. දේශපාලන ක්‍රමය කෙරෙහි ජනතාව ප්‍රකාශ කරන විශ්වාස, ආකල්ප හා අගය කිරීම්වලින් සමන්විත වේ.
4. ලෝකයේ අද සිදුවෙමින් පවතින දේශපාලන සංසිද්ධීන් පිළිඹිබු කරයි.
5. විවිධ දේශපාලන ක්‍රම සංසන්දනය කිරීම සඳහා යොදා ගත හැකි සංකල්පයක් වේ.

19. දේශපාලන පක්ෂ,

1. බලය දිනා ගැනීම හරහා ආණ්ඩු බලය ක්‍රියාවට නැංවීමේ අරමුණින් සංවිධානය වූ සංවිධානය වේ.
2. නිල දේශපාලන ආර්ථික හා සමාජ මතවාදයක් සහිතව සංවිධානය වූ සංවිධාන වේ.
3. රාජ්‍යය සහ සිවිල් සමාජය එකට යා කරන්නා වූ වැදගත් පුරුකක් වේ.
4. සමාජය තුළ සමාජ හා ආගමික මතභේද ඇති කරන්නා වූ එක් මූලාශ්‍රයක් වේ.
5. ප්‍රජාතන්ත්‍රවාදය සමඟ ඉතාම කිට්ටුවෙන් සම්බන්ධ වන අතර එම දෙක එකිනෙකින් වෙන් කළ හැකි නොවේ.

20. පළාත් පාලන ආණ්ඩුක්‍රම

1. නිශ්චිත ප්‍රාදේශීය බල ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක වන විශේෂිත ආණ්ඩුක්‍රමයක් වේ.
2. ස්වාධිපති බලයේ හිමිකමක් නොමැති ආණ්ඩුක්‍රමයක් වේ.
3. ස්ව පැවැත්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පූර්ණ ලෙස සහතික කරන ලද ආණ්ඩුක්‍රමයක් වේ.
4. මධ්‍යම බල අධිකාරියෙන් අවධාරිත බලතල හා කාර්යයන් බුක්ති විඳින ආණ්ඩුක්‍රමයක් වේ.
5. මධ්‍යම බල අධිකාරියට මුළුමනින්ම යටත් වූ ආණ්ඩුක්‍රමයක් වේ.

අංක 21 - 23 තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ 5ක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරින් හතරක් සාවද්‍ය වේ. සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

21. අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යවල ප්‍රධාන අරමුණ වන්නේ,

A ජාතික භාෂාව හා සංස්කෘතිය වර්ධනය කිරීම.
B ජාතික ආශාවන් වර්ධනය කිරීම.
C අනෙක් ජාතීන් සමඟ මිත්‍ර සම්බන්ධතා වර්ධනය කිරීම.
D ජාතික මතවාදය වර්ධනය කිරීම.
E එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ සම්බන්ධතා වර්ධනය කිරීම.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

22. රාජ්‍ය ප්‍රතිපත්ති,

A ජනතාවගේ පොදු යහපත වර්ධනය කිරීම උදෙසා ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් වේ.
B ලාභය ඉහළ නැංවීම සඳහා පෞද්ගලික සමාගමක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් වේ.
C සාමාජිකයන්ගේ සුභ සාධනය ඉහළ නැංවීම සඳහා ග්‍රාම සංවර්ධන සමිතියක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් වේ.
D නිමැවුම ඉහළ නැංවීම සඳහා ආණ්ඩුවේ සංස්ථාවක් විසින් සැලසුම් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් වේ.
E තම පෞද්ගලික ආශා ප්‍රවර්ධනය කිරීම සඳහා බලපෑම් කණ්ඩායමක් විසින් සැලසුම් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් වේ.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

23. සමාජ ගැටුමක් යනුවෙන් අදහස් කරන්නේ,

A සංවිධානයක අභ්‍යන්තරයේ ඇතිවන ගැටුමකි.
B සමාජ කණ්ඩායම් අතර ඇතිවන ගැටුමකි.
C පුද්ගලයාගේ අභ්‍යන්තරයේ ඇතිවන ගැටුමකි.
D පක්ෂයක අභ්‍යන්තරයේ ඇතිවන ගැටුමකි.
E ආණ්ඩුවක අභ්‍යන්තරයේ ඇතිවන ගැටුමකි.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

අංක 24 - 30 දක්වා ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න.

24. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ වර්ධනය වූ දේශපාලන හා ආර්ථික වශයෙන් වැදගත් ක්ෂේත්‍ර කීපයක් වන්නේ,

A ජනතා නියෝජනය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය
B නිදහස් ශ්‍රම වෙළඳපොල
C ස්වාධීන සහ ඒකීය අධිකරණ ක්‍රමය
D මධ්‍යගත හා ස්වාධීන පරිපාලන ක්‍රමය
E පිරිවෙන් අධ්‍යාපනය

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5. ABCE

Learning Resource Center
R
De Mazenod College
Kandana

25. වාර්ගික නියෝජනය,

A 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන්නේය.
B ලාංකික සමාජය තුළ වර්ගවාදය උත්සන්න වීම කෙරෙහි බෙහෙවින්ම හේතු වූ දෙයක් විය.
C සුළුතර ජන කොටස් බොහෝ සෙයින් ප්‍රියමනාපය දැක් වූ ක්‍රමයක් විය .
D නියෝජනය සඳහා හොඳ මූල ධර්මයක් ලෙස ලංකා ජාතික සංගමය පිළිගත්තේය.
E 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් අහෝසි කළේය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

26. 1911 - 1924 කාලය තුළ ක්‍රියාත්මක කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ,

A විධායක කාරක සභා ක්‍රමය පදනම් කර ගත් ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කරණ ලදී.
B ව්‍යවස්ථාදායක සභාවේ නියෝජිත සංඛ්‍යාව වැඩි කරන ලදී.
C ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සමාජිකයන්ගේ බලතල වැඩි කරන ලදී.
D නිළ නොලත් සාමාජික සංඛ්‍යාව වැඩි කරන ලදී.
E සීමිත ඡන්ද බලය හඳුන්වා දෙන ලදී.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

27. 1924 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය මගින් ,
A ආණ්ඩුකාරවරයාගේ බලතල පුළුල් ලෙස කප්පාදු කරන ලදී.
B ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය පුළුල් කරන ලදී.
C නිළ නොලත් මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව වැඩි කරන ලදී.
D වාර්ගික නියෝජනය වෙනස් නොකරන ලදී.
E වගකීමෙන් බලය වෙන් කිරීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි වියි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

28. ජාතික ව්‍යාපාරය,

A බටහිර අධ්‍යාපනය ලත් මධ්‍යම පන්තිය විසින් ආරම්භ කොට මෙහෙයවන ලදී.
B සමාජයේ සියලුම සමාජ ස්ථර අන්තර්ගත ජනතා ව්‍යාපාරයක් විය.
C ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හරහා වගකීමේ ආණ්ඩුවක් ලබා ගැනීමට උද්ඝෝෂණය කළේය.
D විචාරකයන්ට අනුව දකුණු ආසියාවේ වඩාත්ම සාමකාමී ජාතික ව්‍යාපාරවලින් එකක් විය.
E වර්ගවාදී බෙදීම හේතුවෙන් 1921 පසු කාලය තුළ දුර්වල විය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

29. ලංකා ජාතික සංගමය,

A 1919 දෙසැම්බර් 11 දින පිහිටුවන ලදී.
B ඉහළ මධ්‍යම පන්තියේ උගත් හා ධනවත් පුද්ගලයින් විසින් සංවිධානය කළේය.
C ජත්‍ර සංවිධානයක් විය.
D නිදහස් ව්‍යාපාරය උදෙසා සාමාන්‍ය ජනතාව මෙහෙයවීමට උනන්දු නොවීය.
E පහත රට සිංහල බෞද්ධ මධ්‍යම පන්තියේ පුද්ගලයින් විසින් ඇරඹූ සංවිධානයක් විය.

30. මුදල් කාරක සභාව,

A පිහිටවූයේ 1907 වර්ෂයේ දී හෙන්රි මැකලම් ආණ්ඩුකාරවරයා විසිනි.

B සමන්විත වූයේ ප්‍රධාන ලේකම්, ප්‍රධාන ආදායම් පාලක නිලධාරි, භාණ්ඩාගාරික සහ සියලුම නිල නොලත් සාමාජිකයන්ගෙනි.

C ව්‍යවස්ථාදායක සභාවේ සැසිවාර නොපැවැත්වෙන අවස්ථාවල දී මුදල් පනත් පිළිබඳව ක්‍රියා කිරීමේ බලය භුක්ති වින්දේය.

D 1912 - 1920 දක්වා පැවති කෲව් මැකලම් ආණ්ඩුක්‍රමය යටතේ නොසලකා හරින ලදී.

E මුදල් කරුණු සම්බන්ධයෙන් මිත්‍රශීලීව කටයුතු කිරීමට නිලලත් සහ නිල නොලත් සාමාජිකයන්ට බෙහෙවින්ම ප්‍රයෝජනවත් විය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

අංක 31 සිට 35 තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාලව ප්‍රකාශ පහක් සපයා ඇත. ඒවායෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

31. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

A විධායක කාර්යයන් කිරීම සඳහා ආණ්ඩුකාරවරයා අමාත්‍ය මණ්ඩලය සහ විධායක කාරක සභා සහිත යාන්ත්‍රණය හඳුන්වා දුන්නේය.

B ආණ්ඩුකාරවරයාගේ තත්වය නාමික විධායක මට්ටමට පහත දැමීය.

C අමාත්‍ය මණ්ඩලය වාර්ෂික අයවැය සම්බන්ධයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට වගකීමට යටත් කළේය.

D ඇතැම් කොන්දේසි වලට යටත්ව අවුරුදු 21ට වැඩි සියළු දෙනාට ඡන්ද බලය ප්‍රදානය කළේය.

E ව්‍යවස්ථාදායක හා විධායක කාර්යයන් දෙකම පැවරුණු රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් හැඳින්වූ නියෝජ්‍ය සභාවක් පිහිටු විය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

32. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ රාජ්‍ය නිලධාරින් තිදෙනා

A නිල බලයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සහ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය හිමි වූ යටත් විජිත ආණ්ඩුවේ නියෝජිතයන් විය.

B රාජ්‍ය මන්ත්‍රණ සභාවට සාමූහිකව වගකීමට යටත් කළේය.

C ලාංකික අමාත්‍යවරුන්ට උපදෙස් දෙන්නන් ලෙස ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කළේය.

D ආණ්ඩුකාරවරයා සමඟ එක්ව වෙනම විධායක මණ්ඩලයක් ලෙස ක්‍රියා කරන ආකාරය දැකිය හැකි විය.

E ව්‍යවස්ථාවේ මුර බල්ලන් ලෙස හඳුනා ගනු ලැබීය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE33. 1948 සෝල්බරි

33. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

A බ්‍රිතාන්‍ය පාලකයින් විසින් නිදහස සමඟ ප්‍රදානය කළ නිදහස් ලංකාවේ ප්‍රථම ව්‍යවස්ථාව විය.

B සමාන බලැති මණ්ඩල දෙකක් සහිත ව්‍යවස්ථාදායක සභාවක් සැපයුවේය.

C 1944 ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල කෙටුම්පත මත මූලික වශයෙන් පදනම් විය.

D සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළේය.

E 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ස්ථාපිත කිරීමත් සමඟ අහෝසි විය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

Learning Resource Center
R
De Mazenod College
Kandana

34. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

A බ්‍රිතාන්‍ය වෙස්මිනිස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතියට සමාන ආණ්ඩුක්‍රමයක් ප්‍රදානය කළේය.
B සත්‍ය විධායකය නමින් හැඳින්වනු කැබිනට් මණ්ඩලයට විධායක බලතල පැවරිය.
C සීමිත ව්‍යවස්ථාදායක බලයක් සහිත පාර්ලිමේන්තුව නමින් හැඳින්වුනු ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවිය.
D සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂ ආරක්ෂක විධි විධාන සැපයුවේය.
E අගමැතිවරයා විසින් පත් කළ නාමික විධායක තනතුරක් හඳුන්වා දුන්නේය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

35. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

A මහා බ්‍රිතාන්‍ය සමඟ පැවති සියලු ව්‍යවස්ථා සම්බන්ධතා අත් හැරීමේ සංධිස්ථානය සනිටුහන් කළේය.
B ලංකාවේ නිල නාමය "ශ්‍රී ලංකාව" ලෙස වෙනස් කළේය.
C සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ කැබිනට් ක්‍රමය තවදුරටත් පවත්වාගෙන ගියේය.
D රට තුළ ජීවත් වූ සියලුම ඉන්දියානු ද්‍රවිඩයන්ට පුරවැසිකම ප්‍රදානය කළේය.
E අධිකරණ සේවය හා සිවිල් සේවය දේශපාලන විධායකය යටතට පත් කළේය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

36 සිට 40 තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාවට අදාල ප්‍රකාශ පහක් සපයා ඇත. ඒවායෙන් ප්‍රකාශ හතරක් සාවද්‍ය වේ. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

36. 1972 ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාව

A සෝල්බරි ව්‍යවස්ථාව යටතේ තිබූ ව්‍යවස්ථාදායකයට සමාන විය.
B ඡන්දයෙන් හා නාමකරණයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරු දෙවර්ගයෙන්ම සමන්විත විය.
C පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යාය මත ස්ථාපිත කළ ආයතනයක් විය.
D යටත් පිරිසෙයින් මාසෙකට වරකවත් සැසිවාර පැවැත්විය යුතුය.
E ජනාධිපති නමින් හැඳින්වූ නාමමාත්‍ර විධායකය මුලසුන දැරිය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

37. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ආණ්ඩුක්‍රමය

A ජනාධිපති ආණ්ඩුක්‍රමයට ආවරණය වූ රාජාණ්ඩු පාලන ක්‍රමයක්ය.
B ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තෝරා ගන්නා ජනාධිපතිවරයෙකු ගෙන් ආවරණය වූ ඒකාධිපති ක්‍රමයක්ය.
C ප්‍රංශ ජනාධිපති ක්‍රමයට සමානව යන දෙමුහුන් විධායක ක්‍රමයක්ය.
D ඇමරිකානු ජනාධිපති ක්‍රමයට සමාන ජනාධිපති ක්‍රමයක්ය.
E ජනාධිපතිවරයෙකු විසින් විධායකයේ නායකත්වය දරණ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක්ය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

38. 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තුව

A පාර්ලිමේන්තුව ස්වාධිපති මූලධර්මය මත ගොඩ නගා ඇත.
B සමන්විත වන්නේ ජනතාව විසින් තෝරා පත් කරන නියෝජිතයන්ගෙන් පමණි.
C වසර පහක නිල කාලයක් සඳහා තේරී පත්වන ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක් වේ.
D අගමැතිවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයාට විසුරුවා හැරිය හැක.
E නීති සම්පාදනය සම්බන්ධයෙන් පූර්ණ ව්‍යවස්ථාදායක බලය හිමි කර ගෙන ඇත.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

39. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය යටතේ පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යය වන්නේ,

A උසස් රාජ්‍ය නිලධාරීන් පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිට හා කැබිනට් මන්ඩලයට සහාය වීම.
B යහපාලන ආණ්ඩුකරණය හා සම්බන්ධ කරුණු පිළිබඳව කටයුතු කිරීමට ජනාධිපත්ට සහාය වීම.
C සමහර ස්වාධීන කොමිෂන් සභාවලට පත් කිරීම සඳහා ජනාධිපතිට නිර්දේශ සැපයීම.
D රාජ්‍ය සේවකයින්ගේ වංචා සහ දූෂණ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ජනාධිපතිට සහාය වීම.
E අමාත්‍යංශ ලේකම්වරුන් පත් කිරීම සඳහා ජනාධිපතිට සහාය වීම.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

40. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත මූලික අයිතිවාසිකම්

A මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් අයිතිවාසිකම්වලට කිසිසේත්ම සමාන නැත.
B භුක්ති විඳිය හැක්කේ පුරවැසියන්ට පමණි.
C අධිකරණ විනිශ්චයකට යොමු කළ හැක්කේ උල්ලංඝණය වීම විධායක ක්‍රියාවක් මඟින් සිදුවුවහොත් පමණි.
D ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශිත මහජන ස්වාධිපතිත්වයේ නොබිඳිය හැකි කොටසක් වේ.
E රාජ්‍ය සහ අධිකරණය අතර ගැටුම් ඇති වීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන මූලාශ්‍රය ලෙස සැලකේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

පහතින් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ 1978 පෙර පැවති සහ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ ක්‍රම දෙකට අදාල ප්‍රකාශ කීපයකි. එම ප්‍රකාශ අදාල කරගෙන අංක 41-42 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A නොදියුණු දේශපාලන සංස්කෘතියක් සහිත රටකට වඩාත් යෝග්‍ය වේ.
B පළමුව දිනුම් කණුව පසු කරන්නා යන මූලධර්මය මත ජයග්‍රාහී අපේක්ෂකයා තෝරා ගනී.
C මැතිවරණ දිස්ත්‍රික්ක පදනම මත මැතිවරණ පැවැත්වේ.
D සුළු ජාතීන්ට වඩාත් වාසිදායක යැයි සැලකේ.
E තනි මන්ත්‍රී ඡන්ද කොට්ඨාස හෝ බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාසවලින් මැතිවරණ ආසන සමන්විත විය හැකිය.
F ලැයිස්තු පදනමින් හෝ මනාප ඡන්ද ක්‍රමය මත මැතිවරණ පැවැත්වේ.
G පුරප්පාඩු සිදු වූ විට අතුරු මැතිවරණ පවත්වයි.
H ගණනය කිරීමේ දී ඡන්දවලට හිමි වන්නේ අසමාන වටිනාකමකි.
I ඡන්ද අපතේ යෑම සැලකිය යුතු ඉහළ මට්ටමක පවතී.
J පක්ෂ නායකත්වයේ කතිපයාධිකාරී බලය වර්ධනය වීමට විශාල වශයෙන් දායක වේ.

41. සරල බහුතර නියෝජන ක්‍රමයට අදාල නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

1. ABCD 2. EFGH 3. ABIJ 4. BEGI 5. EFGH

Learning Resource Center R De Mazenod College Kandana

42. සමානුපාතික නියෝජන ක්‍රමටය අදාල නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

1. ACDE 2. BGHI 3. CDFJ 4. CFHJ 5. BDGJ

අංක 43-46 තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාවට අදාල ප්‍රකාශ පහක් සපයා ඇත. ඒවායින් එක් ප්‍රකාශයක් සාවද්‍ය වේ. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

43. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය,

1. ජනරජයේ ඇති අවසාන සහ උත්තරීතර ලේඛනෝපගත කිරීමේ අධිකරණය වේ.
2. අග්‍රවිනිශ්චයකාරවරයා සහ හය දෙනෙකුට නොඅඩු දස දෙනෙකුට නොවැඩි වෙනත් විනිශ්චයකාරවරුන් ගෙන් සමන්විත වේ.
3. ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ එකම සහ පරම අධිකරණ බලය දරන්නා වේ.
4. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් විභාග නිරීමේ එකම සහ පරම අධිකරණ බලය දරන්නා වේ.
5. එයට පවරා ඇති කාරණාවලට අදාල අධිකරණ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතු වේ.

44. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව,

1. 2001 දී 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළමුව හඳුන්වා දීම සහ ස්ථාපිත කිරීම සිදු කරන ලදී.
2. 2010 දී 18 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ අහෝසි කොට ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාව පිහිටුවන ලදී.
3. 2015 දී 19 වන සංශෝධනය යටතේ නැවත පිහිටුවන ලදී.
4. ආරම්භයේ දී ජනාධිපති උපදේශන මණ්ඩලයක් ලෙස කටයුතු කිරීමේ කාර්යය පමණක් පවරා තිබුණි.
5. පරිපාලන සහ අධිකරණ පත් කිරීම් සම්බන්ධයෙන් ජනාධිපතිගේ බලතලවලට සංවරණයක් ලෙස ක්‍රියාත්මක වීමට පිහිටුවන ලදී.

45. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය,

1. බහු පක්ෂ ක්‍රමයකි.
2. ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක ආධිපත්‍යය සහිත බහු පක්ෂ ක්‍රමයකි.
3. ධනවාදී, සමාජවාදී සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවලින් සමන්විත බහු පක්ෂ ක්‍රමයකි.
4. වාර්ගිකත්ව කාරණාව ඔස්සේ සංවිධානය වී ඇති සමහර පක්ෂ සහිත බහු පක්ෂ ක්‍රමයකි.
5. කේඩර පක්ෂවලින් පමණක් සමන්විත බහු පක්ෂ ක්‍රමයකි.

46. පළාත් සභාවල ආණ්ඩුකාරවරයා,

1. ජනාධිපති විසින් පත් කරනු ලැබේ.
2. පළාත් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වේ.
3. නිලයේ දිවුරුම් දුන් දිනයේ සිට තනතුරේ අවු 5 ක නිල කාලයක් භුක්ති විඳීමේ හිමිකම ඇත.
4. ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් මත පළාත් සභාව කැඳවීමට, කල් තැබීමට සහ විසුරුවා හැරීමට බලය පවරා ඇත.
5. පළාත් සභාව විසින් සරල බහුතර ඡන්දයකින් සම්මත කරන විශ්වාසභංග යෝජනාවකින් ඉවත් කිරීමට යටත් වේ.

47. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන,

1. මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා වශයෙන් වර්ග තුනකින් යුක්ත වේ.
2. එක් අඩක් තෝරා පත් කර ගැනීමෙන් ද සැකසුණු සාමාජිකයන්ගෙන් සමන්විත වේ.
3. තම බල ප්‍රදේශය තුළ ප්‍රජා ප්‍රයෝජ්‍යතා සේවා සැපයීම සම්බන්ධයෙන් වගකිව යුතුවේ.
4. මධ්‍යම ආණ්ඩුවේ පළාත් පාලන අමාත්‍යංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.
5. ස්වාධීන සහ ස්වාධිපති ආයතන නොවේ.

පහතින් දැක්වෙන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා පොදු රාජ්‍ය මණ්ඩලයට අදාල ප්‍රකාශ කීපයකි. එම ප්‍රකාශ යොදා ගනිමින් අංක 48-49 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයට අනුබද්ධ ආයතනයකි.
B ක්‍රමානුකූලව විකාශනය මත ගොඩනැගූ වර්තමාන ලෝකයේ පවත්නා එකම අන්තර් ආණ්ඩු සංවිධානයයි.
C 1945 දී ස්ථාපිත කළ විශ්වීය අන්තර් ආණ්ඩු සංවිධානයකි.
D. සීමිත අරමුණු සහිත මැද මට්ටමේ අන්තර් ආණ්ඩු සංවිධානයකි.
E ප්‍රධාන ආයතන හයකින් සමන්විත වේ.
F බැඳීම් සහිත ඡන්ද මත ක්‍රියාත්මක වනවාට වඩා කැමැත්ත සහ පෙළඹවීම මත ක්‍රියාත්මක වේ.
G වසරක් හැර වසරක රැස්වීම් පැවැත්වේ.
H ප්‍රධාන සාකච්ඡා සභාව මහා මණ්ඩලයයි.
I අන්තර්ජාතික සාමය සහ සුරක්ෂිතතාව පවත්වාගෙන යාම මූලික අරමුණ වේ.
J බ්‍රිතාන්‍ය රැජිනගේ අනුග්‍රහය යටතේ සෑම වර්ෂයකම රැස්වීම් පවත්වයි.

48. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අදාල නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

1. ACDE 2. BGHI 3. CDFJ 4. CEHI 5. BDFJ

49. පොදු රාජ්‍ය මණ්ඩලයට අදාල නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

1. ACDE 2. CEHI 3. CDFJ 4. CFHJ 5. BDFJ

50. ලංකා ඉතිහාසයේ අගමැතිවරයෙකුට එරෙහිව ඉදිරිපත් කරනු ලබන .......................... විශ්වාසභංගය ලෙස දැක්විය හැක.

1. පළමුවන 2. දෙවන 3. තෙවන 4. සතරවන

# ද මැසිනොද් විදුහල - කඳාන
## දේශපාලන විද්‍යාව II කොටස

A කොටස

කාලය පැය 3 යි.

6.04.2018

Learning Resource Center
De Mazenod College
Kandana

01. "රාජ්‍යය සමාජ සංවිධානයකි."
"රාජ්‍යය පංති ආයුධයකි."
රාජ්‍යය පිළිබඳව මෙම අර්ථකථන දෙක සැපයූ දේශපාලන විද්‍යා ගුරු කුල දෙක නම් කරන්න.

1. ..........................................
2. ..........................................

02. සමාජ සම්මුතිවාදය ගොඩනගා තිබෙන්නේ සමාජ ක්‍රම දෙකක් පදනම් කරගෙනය. මෙම සමාජ ක්‍රම දෙක නම් කරන්න.

1. ..........................................
2. ..........................................

03. "බලය මඟින් මිනිසා දූෂණය වේ. අධික බලයෙන් අධික ලෙස දූෂණය වේ."
"නිරන්තර අත්දැකීම් මඟින් අපට පෙන්වා දෙන්නේ බලය හිමි වී ඇති සෑම මිනිසෙක්ම එම බලයට සීමා පනවන තුරු බලය අයථා ලෙස යෙදීමට පෙළඹෙන බව සහ බලය පවත්වා ගෙන යාමට උත්සහා දරණ බවය."
බලය පිළිබඳව ඉහත දැක්වූ ප්‍රකාශ දෙක ඉදිරිපත් කළ දේශපාලන දාර්ශනිකයින් දෙදෙනා නම් කරන්න.

1. ..........................................
2. ..........................................

04. සිවිල් ආණ්ඩුව පිළිබඳ සම්මුතීන් දෙකක් සහ දාස් කැපිටාල් (ජාතීන්ගේ ධනය) කෘතීන් දෙකේ කතෘවරුන් දෙදෙනා නම් කරන්න.

1. ..........................................
2. ..........................................

05. රාජ්‍යයේ බලය විමධ්‍යගත කිරීම සහ සංකේන්ද්‍රණය කිරීම පදනම් කරගෙන ආණ්ඩුක්‍රම වර්ග දෙකකට බෙදනු ලැබේ. මෙම වර්ග දෙක නම් කරන්න.

1. ..........................................
2. ..........................................

06. බලතල බෙදීම.
පාර්ලිමේන්තු ස්වාධිපතීත්වය
දේශපාලන සංකේත
අධිකරණ විවරණ බලය

ඉහත දක්වා ඇති විධික්‍රම අතුරින් ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා යොදා ගත හැකි විධි ක්‍රම දෙක නම් කරන්න.

1. ..........................................
2. ..........................................

07. කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායකය කොටස් දෙකකින් සමන්විත වේ. කොටස් දෙක නම් කරන්න.

1. ..........................................
2. ..........................................

08. කොංග්‍රස් මණ්ඩලය නමින් හැඳින්වෙන ඇමරිකානු එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය සමන්විත වන්නේ මණ්ඩල දෙකකිනි. එම මණ්ඩල දෙක නම් කරන්න.

1. ..........................................
2. ..........................................

09. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලය සමන්විත වන්නේ සාමාජිකයන් වර්ග දෙකකිනි. එම වර්ග දෙක නම් කොට ඒ ඒ වර්ගයට අයත් සාමාජික සංඛ්‍යාව සඳහන් කරන්න.

1. ..........................................
2. ..........................................

10. රාජ්‍ය ප්‍රතිපත්ති චක්‍රය අවධි හයකින් සමන්විත වේ. එයින් අවධි දෙකක් නම් කරන්න.
1. ..........................................
2. ..........................................

11. 1833,1911,1920,1924 යන වර්ෂවල දී ක්‍රියාවට නංවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායක සභා සමන්විත වූයේ මන්ත්‍රීවරුන් වර්ග දෙකකිනි. එම දෙවර්ගය සඳහන් කරන්න.

1. ..........................................
2. ..........................................

12. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ පිහිටවූ රාජ්‍ය මන්ත්‍රණ සභාව සාමාජිකයින් 61 දෙනෙකුගෙන් සමන්විත වූ අතර එයින් 58 දෙනෙකු තෝරා පත් කර ගත්තේ ක්‍රම දෙකකට අනුවය. එම ක්‍රම දෙක සහ ඒ ඒ ක්‍රමය යටතේ පත්කර ගත් මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව පිළිවෙලින් සඳහන් කරන්න.

1. ..........................................
2. ..........................................

13. 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටවූ මහජන මන්ත්‍රී මණ්ඩලය සමන්විත වූයේ ක්‍රම දෙකක් අනුව තෝරා පත්කර ගත් මන්ත්‍රීවරුන්ගෙනි. එම තෝරා පත්කර ගැනීමේ ක්‍රම දෙක සඳහන් කරන්න.

1. ..........................................
2. ..........................................

14. 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ සහ 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය හැඳින්වීම සඳහා භාවිත කළ නිල නාම දෙක පිළිවෙලින් නම් කරන්න.

1. ..........................................
2. ..........................................

15. I. 1972 ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ව්‍යවස්ථා අධිකරණයේ සංයුතිය දක්වන්න.

II. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කරුණු තීරණය කිරීම සඳහා ව්‍යවස්ථා අධිකරණය කැඳවූ විට ඒ සඳහා සහභාගී වන විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව සඳහන් කරන්න.

1. ..........................................
2. ..........................................

16. 1978 ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය භාෂා ලෙස පිළිගෙන ඇති භාෂා දෙක නම් කරන්න.

1. ..........................................
2. ..........................................

17. 1978 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර තිබෙන ඉහළ අධිකරණ දෙක සහ එම අධිකරණ දෙකේ සංයුතිය සඳහන් කරන්න.

1. ..........................................
2. ..........................................

18. I. ජනාධිපති මැතිවරණ පෙත්සම
II. පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම

ඉහත දක්වා ඇති පෙත්සම් විභාග කිරීමේ අධිකරණ බලය සහිතව 1978 ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති අධිකරණ දෙක පිළිවෙලින් සඳහන් කරන්න.

1. ..........................................
2. ..........................................

19. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය ප්‍රධාන පක්ෂ දෙකක නායකත්වය යටතේ ක්‍රියාත්මක වන බහු පක්ෂ ක්‍රමයක් ලෙස හැඳින්වේ. එම ප්‍රධාන පක්ෂ දෙක නම් කරන්න.

1. ..........................................
2. ..........................................

20. පාර්ලිමේන්තුව නමින් හැඳින්වෙන 1978 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාදායකය සමන්විත වන්නේ ක්‍රම දෙකක් අනුව තෝරා පත් කරන මන්ත්‍රීවරුන්ගෙනි. එම ක්‍රම දෙක සහ ඒ ඒ ක්‍රමය යටතේ තෝරා පත් කරන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව නම් කරන්න.

1. ..........................................
2. ..........................................

B සහ C කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

## B කොටස

01. I. මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නේ කෙසේද?
II. දේශපාලන විද්‍යාව ස්වාභාවික විද්‍යාවකට වඩා සමාජ විද්‍යාවක් ලෙස සලකනු ලබන්නේ කුමන හේතුන් නිසාද? හේතු දක්වන්න.

02. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය තුළ පහත දැක්වෙන ඒවායින් දෙකක කාර්යභාරය විමසන්න.
I. සිවිල් සමාජය
II. යහ පාලනය
III. ජනමාධ්‍ය
IV. දේශපාලන පක්ෂ

03. පහත දැක්වෙන ඕනෑම දෙකක් විභාග කරන්න.

I. පංති අරගලයේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය

II. සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය

III. සමාජ විකාශනයක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය

04. පහත දැක්වෙන ඕනෑම දෙකක් විභාග කරන්න.

I. බ්‍රිතාන්‍ය කැබිනට් ක්‍රමයේ විධායක ව්‍යවස්ථාදායක සබඳතා

II. ඇමරිකානු එක්සත් ජනපදයේ ජනාධිපතිගේ තත්ත්වය කාර්යභාරය සහ බලතල

III. ඉන්දීය සංධීය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

## C කොටස

05. ලංකාව වැඩවසම් ක්‍රමයෙන් ධනවාදයට පරිවර්තනය වීමේ ක්‍රියාදාමයට පදනම දැමුයේ, කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය මඟිනි. ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

06. පහත දැක්වෙන ඕනෑම දෙකක් සසඳමින් වෙනස පහදන්න.

I. සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ නාමික විධායකයේ බලතල කාර්යයන් සහ තත්ත්වය

II. සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය

III. සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ අධිකරණයේ ස්වාධීනත්වය

07. පහත දැක්වෙන ඕනෑම දෙකක් විභාග කරන්න.

I. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු, මුලධර්ම

II. දකුණු ආසියානු සහයෝගිතා සංවිධානයේ අරමුණු සහ මුලධර්ම

III. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය